

‘සසුනට දිරිදෙන - සුරකිමු පිරිවෙණ’ ජාතික වැඩසටහන යටතේ කාර්යක්ෂම සහ උසස් ප්‍රතිඵල සහිත පිරිවෙන් සඳහා මූල්‍ය ආධාර සහ පහසුකම් ලබාදීමේ උත්සවය අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අගෝස්තු 31 වෙනි දින අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රවණාගරයේදී පවත්වන්නට යෙදුණි.

මෙහිදී කාර්යක්ෂම සහ උසස් ප්‍රතිඵල සහිත පිරිවෙන් 10ක් සඳහා පරිවේණාධිපති කාර්යාල ඉදිකිරීම වෙනුවෙන් රුපියල් ලක්ෂ 30 බැගින් ද, රුපියල් ලක්ෂ 09 බැගින් පිරිවෙන් 60ක් සඳහා සනීපාරක්ෂක පද්ධති ආධාර ද, පිරිවෙන් 42ක් සඳහා ගණිත උපකරණ කට්ටල ද බෙදාදීම ද සිදුවිය.

මෙම අවස්ථාවට අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය වී. එස්. රාධක්‍රිෂ්ණන් මැතිතුමා, අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය භාර අතිරේක ලේකම් ආචාර්ය මධුරා එම්. වෙහැල්ල මහත්මිය, පිරිවෙන් අධ්‍යාපන උපදේශක පූජ්‍ය අත්තන්ගනේ සාසනරතන නාහිමි, පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඤාණරතන නාහිමි සහ පළාත් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේලා ඇතුළු ජ්‍යෝෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් රැසක් සහභාගී වූහ.